**නිවේදන අංක:- R/2025/21**

## උතුරු පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු සේවයේ මෝටර් වාහන රියදුරු III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලේකම්ගේ අංක CP/DEC/25 දරණ 2025.11.05 දිනැති ලිපිය මගින් යොමුකරන ලද 2025.10.27 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය ප්‍රකාරව, උතුරු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක NP/01/02/07/01/01 අංක දරණ 2025.11.15 දිනැති ලිපියෙන් ලබාදුන් නිර්දේශයට අනුව, උතුරු පළාතේ පළාත් රාජ්‍ය පරිපාලන නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ අංක NP/02/01/RECRUITMENT/GENERAL දරණ 2025.11.15 සහ 2025.12.15 දිනැති ඉල්ලීම් ලිපිවලට අනුව, උතුරු පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු සේවයේ මෝටර් වාහන රියදුරු III ශ්‍රේණියට අදාළ සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන ප්‍රකාරව පහත සඳහන් පරිදි දිස්ත්‍රික් මට්ටමෙන් පවතින පුරප්පාඩු **පනහක් (50)** සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2025 වර්ෂයේ ජනවාරි මාසයේ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026.01.12** වේ.

**බඳවාගැනීම සඳහා අනුමත කරන ලද දිස්ත්‍රික් මට්ටමෙන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව පහත පරිදි වේ.**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | යාපනය | 25 |
| 02 | වවුනියාව | 08 |
| 03 | මුලතිව් | 05 |
| 04 | කිලිනොච්චිය | 06 |
| 05 | මන්නාරම | 06 |

### 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි

02.1. 2013.07.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද ඒකාබද්ධ රියදුරු සේවයේ මෝටර් වාහන රියදුරු තනතුරට අදාළ සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන, එහි සිදුකරන ලද සංශෝධනවලට අනුව සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක **1817/30** දරණ **2013.07.03** දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති, උතුරු පළාත් මුදල රෙගුලාසි සහ මෙම තනතුර හා සම්බන්ධ කලින් කලට නිකුත් කරනු ලබන නියමයන්, චක්‍රලේඛ, විධිවිධාන යනාදියට යටත්ව තෝරාගන්නා අයදුම්කරුවන් ඒකාබද්ධ රියදුරු සේවයේ මෝටර් වාහන රියදුරු තනතුරේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

02.2. මෙම විභාගයෙන් සමත්වන, පත්වීමක් සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන්, තම පත්වීම් දිනයේ සිට වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව **ඒකාබද්ධ රියදුරු සේවයේ මෝටර් වාහන රියදුරු තනතුරේ III ශ්‍රේණියට** පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඒකාබද්ධ රියදුරු සේවයේ මෝටර් වාහන රියදුරු

තනතුරේ III ශ්‍රේණියට බඳවා ගත් දින සිට **වසර 03 ක්** ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතු අතර වැඩ, පැමිණීම, හැසිරීම සතුටුදායක විය යුතුය.

02.3. මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් **"උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය"** යන කොන්දේසියට යටත් විය යුතුය.

02.4. එක් සේවා ස්ථානයක පත්වීම් ලබන අයදුම්කරුවෙකු, එකී සේවා ස්ථානයේම "අවම වශයෙන් **වසර 05 ක්** අඛණ්ඩව සේවය කළ යුතුය" යන්න අනිවාර්ය කොන්දේසියකි. නමුත් සේවා අවශ්‍යතාවය මත, පත්වීම් බලධාරියා විසින් සේවා ස්ථානය වෙනස් කළ හැකිය.

02.5. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව පත්වීමේ දිනයේ සිට **වසර 03 ක්** අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

02.6. විවෘත තරඟ විභාගය මගින් බඳවා ගනු ලබන පුද්ගලයින්ගේ සම්පූර්ණ එකතුව **පනහකි (50)**. පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

02.7. කෙසේ වෙතත්, දිස්ත්‍රික් පුරප්පාඩු සංඛ්‍යාවට අනුව එම දිස්ත්‍රික්කය සඳහා අයදුම්කළ, සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්ගෙන් සුදුසුකම්ලත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක දී, බඳවාගැනීමේ පරිපාටියේ 7.2.5.1 (i) වගන්තිය ප්‍රකාරව, එසේ අදාළ දිස්ත්‍රික්කයටත් අනෙකුත් දිස්ත්‍රික් අතර පවතින දුර පිළිබඳ සැළකිල්ලට ගෙන පත්වීම් ලබාදීමේ දී ඊළඟ දිස්ත්‍රික්කය තීරණය කර එම දිස්ත්‍රික්කයේ පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

## 03. වැටුප් පරිමාණය

අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි **PL 3-2025** වැටුප් කේතය අනුව මෝටර් වාහන රියදුරු III ශ්‍රේණිය සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය රු**.42,780 - 10 X 490 - 10 X 540 - 10 X 590 - 12 X 630 - 66,540/=** ක් වේ. (මෙම වැටුප් පරිමාණයේ සිව්වන පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය). කෙසේ වෙතත් ඉහත සඳහන් චක්‍රලේඛයේ **III වන උපලේඛනයෙහි** සඳහන් විධිවිධාන පරිදි නියම කරන ලද වැටුප් මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ.

## 04. සාමාන්‍ය සුදුසුකම්

04.1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

04.2. අයදුම්කරු යහපත් හැසිරීමකින් යුතු පුද්ගලයෙකු විය යුතුය.

04.3. අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර හයක (06) කාලය තුළ අවම වශයෙන් නොකඩවා වසර තුනක (03)

කාලයක් උතුරු පළාතේ පදිංචිව සිටිය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේ දී තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය)

**එසේ නැතහොත්**

අයදුම්කරු හෝ ඔහුගේ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර, උතුරු පළාතේ නොකඩවා වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචි අය විය යුතුය.

**(*සම්මුඛ පරීක්ෂණයේ දී තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය)**

04.4. අයදුම්පත් භාරගන්නා **අවසන් දිනට හෝ ඊට පෙර** මෙම නිවේදනයේ සඳහන් තනතුරට අදාළ සියලුම සුදුසුකම් අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

04.5. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස **අවුරුදු 18** ට නොඅඩු සහ වයස **අවුරුදු 45** ට නොවැඩි විය යුතුය.

## **05.** අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්

### **(05.01)** අධ්‍යාපන සුදුසුකම්

අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව (සිංහල/දෙමළ) ඇතුළත්ව විෂයයන් **දෙකකට (02) සම්මාන සාමාර්ථ (C) සහිතව විෂයයන් හයකින් (06)** දෙවරකට නොවැඩි වාර ගණනක **දී සමත්ව තිබිය යුතුය.** මෙහි දී එක් වරක දී අවම වශයෙන් **විෂයයන් පහකින් (05)** සමත්ව තිබිය යුතුය.

### **(05.02)** වෘත්තීය සුදුසුකම්

පෞද්ගලික / කුලී රථ සහ තාර බර හොන්ඩර 24 ට (CWT) අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් පහත සඳහන් ආකාරයට ලබා තිබිය යුතුය.

අ) බඳවාගැනීම සඳහා වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වසර තුනක (03) ට පෙර;

i. පැරණි රියදුරු බලපත්‍රය අනුව “C” සහ “C1” වාහන පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය.

**හෝ**

ii. නව රියදුරු බලපත්‍රය අනුව “B” පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය.

ආ) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

### **(05.03)** පළපුරුද්ද

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට මෝටර් වාහන රියදුරෙකු වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

**(05.04) ශාරීරික සුදුසුකම්**

අ) අයදුම්කරුගේ උස අවම වශයෙන් අඩි 5 අඟල් 2.5 (158.75cm) විය යුතුය.

ආ) දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර, යහපත් කායික මානසික යෝග්‍යතාවයකින් යුතු අයෙකු විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේ දී රජයේ වෛද්‍ය නිලධරයෙකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය.)

## 06. බඳවා ගැනීමේ පරිපාටිය

**06.1** සේවය සඳහා බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත සිදුකෙරෙනු ඇත. උතුරු පළාතේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ.

(i) යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා අයදුම් කර සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවල දී එම පුරප්පාඩු සංඛ්‍යාව යාබද සියලු දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදා හරිනු ලැබේ.

(ii) පිරවීමට නියමිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව ස්වල්පයක් නම්, එම හේතුව මත දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම අදාළ කරගත නොහැකි වන විට කුසලතා අනුපිළිවෙළින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

(iii) විභාගයේ දී අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ.

**06.2** එක් අයදුම්කරුවෙකුට අයදුම් කළ හැක්කේ එක් දිස්ත්‍රික්කයක පුරප්පාඩු සඳහා පමණි. අයදුම්කරු උතුරු පළාතේ කුමන දිස්ත්‍රික්කයක් තම ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය වුව ද පත්වීමක් බලාපොරොත්තුවෙන් තමන් කැමති දිස්ත්‍රික්කයකට අයදුම් කළ හැකිය. පත්වීමක් බලාපොරොත්තුවෙන් අයදුම් කරන දිස්ත්‍රික්කය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

ඒ අනුව, යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරඟ කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් අංකය |
|---|---|
| යාපනය | 01 |
| මන්නාරම | 02 |
| වවුනියාව | 03 |
| කිලිනොච්චිය | 04 |
| මුලතිව් | 05 |

සටහන

පත්වීම සඳහා තෝරාගන්නා දිස්ත්‍රික්කය පිළිබඳව අයදුම්පත්‍රයේ **14 වන වගන්තියෙහි** නොවරදවා සම්පූර්ණ කර තිබිය යුතුය. තවද පත්වීම සඳහා දිස්ත්‍රික්කය තීරණය කළ පසු කිසිසේත් එය නැවත වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

**06.3** 06.1 ඡේදයේ සඳහන් ගැළපෙන කාණ්ඩයකයකට අදාළ තෝරාගන්නා අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් අවශ්‍ය මූලික සුදුසුකම් සම්පූර්ණ කර තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

**06.4** සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය මගින් සුදුසුකම් සනාථ කරගත් අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයට (Trade Test ) කැඳවනු ලැබේ.

**06.5** කෙසේ වෙතත් ඉහත වෘත්තීය පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් 6.01 ඡේදයෙහි සඳහන් කාණ්ඩයක් යටතේ ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබේ.

## 07. විභාග ගාස්තු

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස **රු.500/=** මුදලක් උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට ගෙවා, අදාළ ලදුපත අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම්කිරීමේ පිළිවෙල

08.1. මෙම දැන්වීම සමග නිකුත් කරනු ලබන අයදුම්පත www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවිය වෙත පිවිස බාගත කරගෙන, එය සම්පූර්ණ කර **අයදුම්පත් භාරගන්නා අවසාන දින** හෝ ඊට පෙර ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

08.2. ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" NP/07/10/01/210 "** යනුවෙන් සඳහන් කළ යුතුය.

08.3. ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ.

08.4. අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

08.5. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. කෙසේ වෙතත්, **විභාග ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.**

08.6. ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 05 කට වත් පෙර විභාගය ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2219939** / ෆැක්ස් අංකය - **021-2219940** / විද්‍යුත් තැපැල - **examppscnp@gmail.com**)

- විභාගයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපෑලේ අංකය සහ දිනය
- විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ සහතික කළ පිටපතක්

## 09. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

09.1 අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකිවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කුමන හෝ ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii). වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ විභාගයට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **"උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ"** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය. එකී නීති රීතිවලට පටහැනිව කටයුතු කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් විය යුතුය.

09.2 තවද, අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත හැකි පරිදි මුහුණ සහ ඉලෙක්ට්‍රෝනික උපාංග පැළඳ නොසිටින බව තහවුරු කරගැනීම සඳහා කන් දෙකම ආවරණය නොකර විභාග ශාලාවට ඇතුළු විය යුතුය. තවද, එසේ තහවුරු කරගැනීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරනු නොලැබේ. තවද, විභාග ශාලාවට ඇතුළත්වූ මොහොතේ සිට විභාගය අවසන් වී විභාග ශාලාවෙන් පිටත්ව යන තුරු අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු වන ආකාරයෙන් මුහුණ සහ කන් දෙක ආවරණය නොකර සිටිය යුතුය.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

## 11. අත්සන සහතික කිරීම

සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ. දැනට රාජ්‍ය සේවයේ නිරත පුද්ගලයෙකු මේ සඳහා අයදුම් කරන්නේ නම් ඔහු/ඇය තම ආයතන ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් තම අත්සන සහතික කරවා ගත යුතුය. එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්වයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රු.854,880.00 ට නොඅඩු මාසික වැටුපක් ලබන ස්ථිර රාජ්‍ය හෝ පළාත් පාලන හෝ පළාත් සභා නිලධාරියෙකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරණ අයෙකු හෝ ලබා සහතික කරවා ගත යුතුය.

## 12. විභාග පරිපාටිය

මෙම විභාගය, ලිඛිත පරීක්ෂණය, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ වෘත්තීය පරීක්ෂණය (Trade Test ) යන කොටස්වලින් සමන්විත වේ. ලිඛිත පරීක්ෂණය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වන අතර, මෙම විභාගය සඳහා ලැබෙන අයදුම්පත්‍ර අනුව සිංහල සහ දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. අයදුම්කරුවෙකු තමන්ට අදාළ භාෂා මාධ්‍ය තෝරා ගත යුතු අතර, විභාගයට අදාළ සියලුම ප්‍රශ්න පත්‍රවලට එම භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

### 12.1 ලිඛිත පරීක්ෂණය

| අනු අංකය | ප්‍රශ්න පත්‍රය | විෂයය අන්තර්ගතය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝගතාවය | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කානුකූලව තීරණ ගැනීමේ හැකියාව සහ සාමාන්‍ය බුද්ධිය යනාදිය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. | පැය 01 | 100 |

| | | | | |
|---|---|---|---|---|
| 02 | භාෂා හැකියාව | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ තේරුම්ගැනීමේ හැකියාව, ලේඛන හැකියාව, භාෂාව, සමාන පද, විරුද්ධ පද, ලිපියක් කෙටුම්පත් කිරීම සහ ව්‍යාකරණ භාවිතය යනාදිය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. | පැය 01 ½ | 100 |

<u>සටහන</u>

මෙම විභාගය තරඟ විභාගයක් වන හෙයින් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලැබීමට නම් එක් එක් ප්‍රශ්න පත්‍රය විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් අවම වශයෙන් සියයට **හතළිහක් (40%)** ලබාගත යුතු අතර, ප්‍රශ්නපත්‍ර දෙක සඳහා වන මුළු ලකුණු සංඛ්‍යාවෙන් අවම වශයෙන් සියයට **පනහක් (50%)** අපේක්ෂකයින් විසින් ලබාගත යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරඟ විභාගයෙන් අයදුම්කරුවන් ලබාගත් වැඩිම මුළු ලකුණුවල එකතුවේ අනුපිළිවෙල (Merit Order) සළකා බලනු ලැබේ.

### 12.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී බඳවාගැනීම සඳහා වන මූලික සුදුසුකම් පරීක්ෂා කර බැලෙන අතර, ඒ සඳහා ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ.

### 12.3 වෘත්තීය පරීක්ෂණය

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්, පහත සඳහන් පරිදි වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලබන අතර, වෘත්තීය පරීක්ෂණයේ දී සෑම විෂයය අන්තර්ගතයටම අදාළව සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය ලබාගත යුතුය.

| අනු අංකය | ලකුණු ලබාදෙන විෂයය අන්තර්ගතය | මුළු ලකුණු සංඛ්‍යාව | සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| 02 | මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| 03 | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |
| **එකතුව** | | **100** | **50** |

<u>සටහන</u>

අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයෙන් සමත් වුවද පත්වීමක් සඳහා තෝරා ගැනීමේ දී විවෘත තරඟ විභාගයේ දී ලබාගත් වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව තෝරාගනු ලැබේ.

## 13. විභාග මධ්‍යස්ථානය

**13.1** විභාගය පැවැත්වීමට බලාපොරොත්තුවන විභාග නගර සහ නගර අංක පහත දැක්වේ.

| නගරය | නගර අංකය |
|---|---|
| යාපනය | 01 |
| මන්නාරම | 02 |
| වවුනියාව | 03 |
| කිළිනොච්චි | 04 |
| මුලතිවු | 05 |

**13.2** යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී, මෙම විභාගය යාබද විභාග නගරයක් වෙත හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් තීරණය කරනු ලබන නගරයකට මාරු කරනු ලැබිය හැක.

## **14.** විභාග ප්‍රතිඵල

විභාග ප්‍රතිඵල උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියෙහි පළකරනු ලබන අතර, තම තමන්ගේ පුද්ගලික විභාග ප්‍රතිඵල ද www.np.gov.lk ⟶ **Exams & Recruitments** ⟶ **Results** යන සබැඳිය මගින් බලාගැනීමටත්, භාගත කිරීමටත් හැකිය.

<u>සැළකිය යුතුය</u>

i. මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

ii. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම පිළිබඳ සම්පූර්ණ බලය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සතුය.

iii. මෙම කරුණ සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

iv. මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

v. මෙම විභාගය පිළිබඳ නිවේදනය www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**ආල්වාප්පිල්ලෙෙ සිරි**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
**2025.12.24**